# අයියයි මල්ලියි

ඔන්න තවත් ලස්සන දවසක්උදාවෙලා. ඉර පායලා ඇවිත්: ලස්සනට මල් පිපිලා: කුරුල්ලෝ හා අනෙකුත් සතුන් ද නාද කරනවා. ඔන්න ඉතින් මේ ලස්සන දවසේ ප්‍රශ්නයක් සිද්ධ වෙන්න තමයි යන්නේ.

අපි බලමුකෝ මොකක්ද වෙන්නේ කියිලා.

ඉතින් එක ගෙදරක අම්මයි, තාත්තයි, අයියයි වගේ ම තව මල්ලියෙකුත් හිටියා. මේ අය හරිම කරුණාවන්තයි. හැමෝට ම ප්‍රිය සේ කටයුතු කළා.

මේ ගෙදර අයියා හරි දක්ෂ, උපක්‍රමශීලී හා බුද්ධිමත් කෙනෙක්. ඒත් මේ මල්ලි නම් බලන්නේ ම එයාට ඕන දේ බලෙන් හරි ගන්න.දවසක් මේ දෙන්නාගේ අම්මා පොළේ  ගිහින් රස බිස්කට් පැකට් එකක් ගෙනල්ලා කුස්සියේ උස තැනකින් තියලා; මේ දෙන්නට කතා කළා.

“ පුතාලා, ටිකක් මෙහෙට එන්නෙ”

“අපෝ ඔන්න අම්මා කතා කරනවා ” මල්ලි මෙහෙම කියනවාත් එක්කම අයියා මෙහෙම කිව්වා.

“ එහෙම කියන්න හොඳ නෑ.”

“අනික එයාලා අපිට වඩා වැඩිමහල්”

“සමහරවිට අම්මා අපට මොනාහරි ගෙනත් ඇති ”

“එන්න යං”


එහෙම කියපු ගමන් මල්ලි දිව්වේ ගෙනා දේවල් කන්න.

අම්මා එයාලට නැවත පැමිණෙන ලෙස හඬ නගා කිවුවා.

බිස්කට් පැකට්ටුව ගැන අම්මා පැහැදිලි කරා.

ඒ ඇසූ මල්ලි අම්මා ගිය පසු හොරෙන් එය ගැනීමට උත්සාහ කරපු නමුත් ගැනීමට නොහැකි වුණා.

“හ්ම්, බලමු තව එක පාරක්”



ඒ සැරේ නම් ඔහු ඒක කළා. මේ දිහා අයියා හොරෙන් බලාගෙන ඉඳලා මේකට උපායක් යෙදුවා.



“මල්ලි, මේක කොහෙන්ද ?”

“ මට යාළුවෙක් දුන්නේ?”

“කොයි වෙලාවෙද?”

“මට මතක නෑ. ඒක ඔයාට වැඩක් නෑ.” කියමින් මල්ලි ඉතා ඉක්මනින් දිව්වා.

අයියා මේක අම්මාට කිව්වා. ඒත් එයා අම්මාට කිව්වා “ අම්මේ, හැබැයි අපි මල්ලිට මොකක් හරි කරන්න ඕනේ. ඒත් දඬුවමක් නෙවෙයි” අම්මයි අයියයි කතාවුණා.

අයියා මල්ලි යන තැන්වල, මල්ලි මොකක්ද කරන්නේ කියලා බැලුවා. එතකොට එයා දැක්කා මල්ලි මොකක් හරි දෙයක් හංගනවා.

අයියා, මල්ලි යනකම් බලන් ඉඳලා ඒ මොකක්ද කියලා බැලුවා.

“අනේ දෙවියනේ මේ අර බිස්කට් පැකට් එක එකනේ.”

“ ඒ කියන්නේ මල්ලි ඇත්තටම මේක අරගෙන. ඉන්නකෝ මම මේක අපි කතා වුණු විදිහට අම්මට දෙනවා.”

කියමින් අයියා ඒක අම්මට දුන්නා.

අම්මා ඒක හැංගුවා. එයාලා මේක ගැන මල්ලිට කිව්වේ නෑ. මල්ලි නැවත ආවා. බිස්කට් එක ගන්න බැලුවා. ඒක එතන නෑ. මල්ලිට තරහා ගියා. අයියා ළඟට ගිහින් රණ්ඩු වෙන්න පටන් ගත්තා.

“ඇයි මල්ලි තරහ ගිහින් ” අයියා හිනා වෙවී ඇහුවා.

“ඇයි ඔයා දන්නේ නැද්ද? ඔයා ඒ බිස්කට් එක අර ගත්තා.”

“අනේ පිස්සුද ? මම මොකටද ඒක ගන්නේ. අනික අම්මා කිව්වනේ ඒක ගන්න එපා කියලා.

මල්ලි ඒ වෙද්දිත් බිස්කට් එකක් කාලයි තිබුණේ.

“කමක් නෑ” කියමින් අයියට එරෙව්වා.

“ ඇයි මට ඔරවන්නේ? මං මුකුත් කලාද”

අයියා විහිලුවට වගේ කිව්වා.

දැන් හවස හතර පහු වෙලා. තේ වෙලාව හන්දා අම්මා ගෙදර අයට කතා කළා.

“දැන් තේ වේල, හැමෝම එන්න.”

ගෙදර හැමෝම තේ මේසේ වටේට ඉඳ ගත්තා. අම්මා තේ කෝප්ප ගෙනාවා. හැබැයි ඒ වෙලේ අම්මා මල්ලිට තේ ගෙනාවේ නෑ. ඊළඟට අම්මා බිස්කට් ගෙනාවා. ඒ වෙලාවෙත් මල්ලිට මුකුත් නෑ. මල්ලි වටපිට බැලුවා. හැමෝම තේ බොනවා. මල්ලිට තේ තිබුනෙ නෑ.

අම්මේ, මට තේ නැද්ද ? මට බඩගිනියි. තේ වේලට බිස්කට්වත් මට නැද්ද?” මල්ලි ඇහුවා.

“ඇයි පුතේ ඔයා කලින් තේ ගත්තනේ.”

“අනේ ඔයාලට මොකද වෙලා තියෙන්නේ ? අපි හැමෝම එකටනේ තේ බොන්නේ, බිස්කට් කන්නේ.

“ පුතේ, ඔයා හිතුවද ඔයාගේ වරද ගැන? ”

“වරද ? මොන වරද ද ?”

අයියා දවල් වෙච්ච දේවල් හෙමිහිට මුමුණමින් අම්මාගේ මුහුණ දිහා බැලුවා. අම්මා එයාගේ මූණ දිහා බැලුවා.

තාත්තට හැබැයි මොනවද වෙන්නේ කියලා තේරුනේ නෑ. මොකද උදේ වෙලාවේ තාත්තා හිටියේ වැඩපළේ .ඔහු එද්දි හවස තුනවත් වෙනවා.ඒ වෙද්දි ගෙදර ගොඩක් දේවල් වෙලයි තිබුනේ.

මල්ලිට මතක් උනා එයා කරපු වැඩේ. ඒත් එයා ඒ වරද පිළිගන්න කැමති වුණේ නෑ.

“ පුතේ, ඔයා කරපු වරද දැන්වත් මතක් උනාද ?”

“අනේ.... මොකක්ද කරපු වරද ?

“ මං මොකක්ද කරපු වරද ? ” මල්ලි කෑගහමින් ඇඬුවා.

“ඇයි මල්ලි මතක නැද්ද ? අම්මා උදේ පොළෙන් ගෙනාව බිස්කට් එක. ඒක අපට කන්න එපා කිව්වා. ඒත් ඔයා ඒක තනියම කෑවා.”

“දන්නවද ? දෙමව්පියෝ කියන දේට අපි කීකරු වෙන්න ඕනේ. ඒ වගේම දෙයක් ඕනනම් අහලා ගන්න වගේම, තමා කරපු වරද පිළිගන්න ඕනේ. තේරුණාද ?”

“සමාවෙන්න, කරපු දේට. මං ආයේ එහෙම කරන්නේ නෑ.” කියා මල්ලි පොරොන්දු වුණා වුණා.

අම්මා මල්ලිට තේ ගෙනාවා. අයියා එයාගේ බිස්කට් එකෙන් බාගයක් දුන්නා.

“එපා අයියේ, අද ඔයා මට හොඳ දෙයක් කියා දුන්නා. අයියා ඕක කන්න.” ගෙදර හැමෝටම සතුටුයි. ආයේ මල්ලි ඒ වගේ දේවල් නොකර සතුටින් හොඳ වැඩ කළා.

වැරදි වන විට

අපි හැදෙයි.

හැබැයි,

හැම වෙලාවෙම නොවේ.

නිමි……